**දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - 03 කොටස - 2021**

---

දක්ෂිණ අධිවේගී මාර්ගය දිගුව ව්‍යාපෘතියේ - 03 කොටසේ 20201 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කල යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

හම්බන්තොට ජාත්‍යන්තර අගනගර සංවර්ධන කටයුතු සඳහා ආධාර කිරීම හා පහසුකම් සැලසීම වෙනුවෙන් මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ එක් ප්‍රධාන අරමුණක් ලෙස හඳුනා ගැනුණි.

ණය ගිවිසුම අනුව, ව්‍යපෘතියේ 03 කොටස යටතේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ කි.මී. 15 ක් වූ වැටිය සිට අන්දරවැව දක්වා දීර්ඝ කිරීමේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 36,174 ක් වූ අතර සිවිල් වැඩ සඳහා ඇස්තමේන්තු ගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 252 කට සමාන රු. මිලියන 31,574 ක් චීනයේ අපනයන ආනයන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි.

ව්‍යාපෘතියේ කටයුතු 2016 ජනවාරි 25 දින ආරම්භ කර තිබුණු අතර, 2018 ජනවාරි 25 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2019 ජුනි 12 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්වාගණනය කල මතය

මෙම වාර්තාවේ 2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2 ඡේදයේ දක්වා ඇති කරුණු මත මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිනුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමණාකරනයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා, හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් ආවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සකසා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලබෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවූවද අවස්තාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ෂවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව/විගණන නිරීක්ෂණය | වටිනාකම (රු.මිලියන) | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව රු. මිලියන 40,997.35 ක ස්ථාවර වත්කම් මාර්ග සංවර්ධන අධිකාරියට (මා.සං.අ) භාරදී තිබුණද, එය රු. මිලියන 37,222.18 ක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ව්‍යාපෘතියේ ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම 2023 මාර්තු 20 දින තෙක් ප්‍රමාද වීම හේතුවෙන්, 2022 දෙසැම්බර් 31 දිනට මා.සං.අ. හි වත්කම් රු. මිලියන 3,775.17 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 3,775.17 | අදහස් දක්වා නොතිබුණි. | ප්‍රමාදයකින් තොරව මා.සං.අ. ගිණුම්වල වත්කම් ප්‍රාග්ධනික කළ යුතුය. |
| (ආ) | ණය ගිවිසුමේ 2.2 වගන්තියට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල බැදීම් ගාස්තු සහ පොලී අයකිරීම් ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් | 3,075.14 | ණය සඳහා පොලී සහ බැඳීම් ගාස්තු මහා භාණ්ඩාගාරය විසින් ඔවුන්ගේ වැය විෂය හරහා ගෙවනු ලබන අතර | පොලී සහ බැඳීම් ගාස්තු ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ලෙස විදේශ ණය ශේෂය සහ මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | | ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබුණි. එම නිසා එය මහා භාණ්ඩාගාරයේ වියදමකි. | |
| (ඇ) | උපදේශන සේවා සඳහා වන ගිවිසුමේ අංක 1.10 දරන විශේෂ කොන්දේසි අනුව, උපදේශන සඳහා ආයතනික බදු ශ්‍රී ලංකා රජය විසින් ගෙවිය යුතුය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව 2021 දෙසැම්බර් 31 දිනට උපදේශන සේවා සඳහා ආයතනික බදු සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 30.20 | උපදේශනය සඳහා වන ගිවිසුමේ විශේෂ කොන්දේසි 1.10 වගන්ති අනුව ශ්‍රී ලංකා රජය විසින් උපදේශන සඳහා ආයතනික බදු ගෙවීම නියම කර ඇතත්, ව්‍යාපෘතිය විසින් මේ දක්වා හඳුනාගෙන ඇති වටිනාකම සමග ගෙවීමට නියෝජිතායතනය (මා.සං.අ) එකඟ වී නොතිබුණි. ඒ අනුව අදාළ වගකීම යථාර්ථවාදීව තක්සේරු කළ නොහැක. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය - 04 හි 18 වගන්තියට අනුව, වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම අදාලවන ණය ගැනීමේ පිරිවැය එම වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කළ යුතුය. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 දිනය ව්‍යාපෘතිය විසින් දේශීය ණය ගැනීම්වලට අදාළව ණය ගැනීමේ පිරිවැය රු. මිලියන 137.41 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ හිමිකම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | - | මෙම ණය සඳහා අදාළ පොලී පිරිවැය එහි මූලික ණය ගැනුම්කරු වන මා.සං.අ. විසින් වෙන වෙනම ගිණුම්ගත කර ඇත. මා.සං.අ. පොත්වල ඇති ණය සේවාකරන හා සම්බන්ධ සියලුම මුදල් ප්‍රවාහයන් සමග ව්‍යාපෘතිය කිසිදු සම්බන්ධයක් නොමැත. මෙම තත්වයන් යටතේ, ණය සේවා කරණ මා.සං.අ. විසින් ගිණුම්ගත කර ඇති අතර ව්‍යාපෘති ගිණුම්වලට ගෙන නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ඉ) | රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ට පටහැනිව, වන්දි හා ප්‍රමාද වූ පොලී සඳහා ප්‍රතිපාදන සපයා නොතිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා ප්‍රමාද වූ පොලී ගෙවීමට සිදු විය. | - | වර්තමානයේ සහ අනාගතයේදී ඉඩම් අත්පත් කර ගැනීම සහ පොලී ගෙවීම් මා.සං.අ. හි මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කෙරේ. | වන්දි හා ප්‍රමාද පොළිය සඳහා ප්‍රතිපාදන සැපයිය යුතුය. |

**3.** **භෞතික කාර්ය සාධනය**

**3.1** **ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

**(i)** **ඉඩම් ලියාපදිංචි කිරීම**

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැ. 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යය සාධනය | 2022 දෙසැ. 31 දිනට අත්කරගත් කාර්යය සාධනය | ප්‍රමාදය / විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| ඉඩම් අත්පත් කර ගැනීම | මා.සං.අ. ට හිමිකම් පැවරීම<br>රජයේ ඉඩම්<br>පුද්ගලික ඉඩම් | 822<br>2,207 | 32 | ව්‍යාපෘතිය 2019 ජූනි 12 දින අවසන් කර තිබුණද, 2021 දෙසැම්බර් 31 වන විටත් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 උප වගන්තිය අනුව මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කර තිබුණේ ඉඩම් කට්ටි 32 ක් පමණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ අකාර්යක්ෂමතාව. |

**කළමණාකරනයේ අදහස් දැක්වීම** — මෙම ව්‍යාපෘතියේ දී ප්‍රාදේශීය ලේකම්වරුන් අත්පත් කර ගැනීමේ නිලධාරීන් ලෙස කටයුතු කරයි. ඒ අනුව, වන්දි ගෙවීමෙන් පසු, 44 වගන්තියේ ක්‍රියාවලියද ඔවුන් විසින් සිදු කරනු ලැබේ.

**විගණකගේ නිර්දේශය** — අමතර වියදම් වළක්වා ගැනීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම් අවසන් කිරීමට උපරිම උත්සාහයක් ගත යුතුය.

**3.2** **කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ශක්‍යතා වාර්තාවේ 8.33 පරිච්ඡේදයට අනුව, දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ 3 කොටසේ සේවා ප්‍රදේශය ඉදිකිරීම සඳහා ස්ථානයක් හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, එය ඇස්තමේන්තු කර නොතිබුණු අතර දක්ෂිණ අධිවේගී මාර්ගයේ සම්පූර්ණ දිගුව සඳහා සේවා ප්‍රදේශ ඉදිකිරීම සඳහා ප්‍රමාණ පත්‍රවල ප්‍රතිපාදන සළසා නොතිබුණි. එබැවින්, අධිවේගී මාර්ග භාවිත කරන්නන් සඳහා වැලිපන්න ප්‍රදේශයෙන් පසු සේවා ප්‍රදේශ කිසිවක් නොතිබුණි. එබැවින් වැලිපැන්නේ සිට කි.මී. 176 ක දුරක් ගමන් කිරීමේදී මහජනතාවට සේවාවන් ලබා ගැනීමට සේවා ප්‍රදේශයක් නොතිබුණි. | කෙසේ වෙතත්, ද.අ.මා.දි. ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත් ප්‍රමාණ පත්‍ර කිසිවක සංකල්පීය අවධියේදී (Conceptual stage) සිවිල් වැඩ කොන්ත්‍රාත්තු හරහා සේවා ප්‍රදේශ ඉදිකිරීමට ප්‍රතිපාදන සපයා නැත. එය සැලසුම්වලට ඇතුළත් කර නොතිබුණද, මාර්ග භාවිතා කරන්නන්ගේ ප්‍රයෝජනය සඳහා ද.අ.මා.දි. ව්‍යාපෘතිය සඳහා දෙවන සේවා ප්‍රදේශයක් පිහිටුවීමේ වැදගත්කම පැහැදිලි කරමින් මා.සං.අ. සභාපතිවරයා විසින් වි.ස.දෙ. හරහා චීනයේ EXIM බැංකුව සමඟ සාකච්ඡා කර ඇත. කෙසේ වෙතත්, චීනයේ EXIM බැංකුව දෙවන සේවා ප්‍රදේශය සඳහා අරමුදල් සැපයීම ප්‍රතික්ෂේප කර ඇත. | ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක කාලෝචිතව සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

3.3 කාර්ය සාධන දර්ශක සාක්ෂාත් කර ගැනීම

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| වැටිය සිට අන්දරවැව දක්වා ආසන්න වශයෙන් කි.මී. 15 ක් වූ දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ 3 කොටස මාතර සිට අන්දරවැව සහ හම්බන්තොට හරහා මත්තල දක්වා වූ ප්‍රවේශ පාලන අධිවේගී මාර්ගයේ තෙවැනි කොටස වේ. ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, පරිසර හිතකාමී අධිවේගී මාර්ගය සැපයීම, ගමන් කාලය අඩුකරමින් විදේශ ආයෝජකයින් දිරිමත් කිරීම යනාදිය ව්‍යාපෘති අරමුණු ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද, කාර්ය සාධන දර්ශක සැකසීම සහ දර්ශක සාක්ෂාත් කර ගැනීම ඇගයීම පිළිබඳව විගණනයට අණාවරණය නොවුණි. | ව්‍යාපෘති අරමුණු ඇතුළත් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව ඉදිරිපත් කර ඇත. | කා.සා.ද. ස්ථාපනය කර ව්‍යාපෘතිය අවසානයේ ඇගයීම් සිදුකළ යුතුය. |